**පිළිසරු ව්‍යාපෘතිය**

-----------------------

1. **මතය**

------

මගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් හේතුවෙන් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යය සාධනය සියලුම ප්‍රමාණාත්මක කරුණු සාධාරණව දැක්වෙන පරිදි 2010 දෙසැම්බර් 31 දිනට උපලේඛන සමඟ වූ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අනෙකුත් සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශන සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණ බව, සහ සපයනු ලැබූ අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහාම යොදා ගෙන තිබුණු බවයි.

2. **විගණන නිරීක්ෂණ**

----------------------

2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ඉදිකිරීමේ කොන්ත්‍රාත් 5 කට අදාල රු:6,874,089 ක් වූ රැඳවුම් මුදල (Retention) ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ii) අවස්ථා 09 කට අදාල උපචිත වියදම් රු:1,180,898 ක් ගිණුම් වලින් අත්හැර තිබුණි.

(iii) අවස්ථා 4 කදී වැඩ පූර්ව අත්තිකාරම් ලෙස ලබා දුන් අත්තිකාරම් වලින් 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු:20,909,285 ක් ගිණුම් වලින් අත්හැර තිබුණි.

(vi) කළුතර කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් 20 කගේ අයකරන ලද ආපසු ගෙවිය යුතු (Refundable Tender Deposit) ටෙන්ඩර් තැන්පතු මුදල රු:200,000 ක් ආපසු ගෙවීමේදී සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(v) 2008 වර්ෂයෙ සිට ආරම්භ කරන ලද මෙතෙක් නිම නොකරන ලද ව්‍යාපෘති 07 ක දරන ලද රු:217,732,949 ක පිරිවැය නොනිමි වැඩ ලෙස ගිණුම් ගත කරනු වෙනුවට ඒ ඒ වර්ෂයේ දරන ලද වියදම් අදාල වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

## 2.2 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

ලිපිගොනු අනුව කොම්පෝස්ට් බඳුන් ලැබීම් 17,000 ක් වු අතර තොග පොතට අනුව නිකුත් කිරීම් 7,737 ක් විය. ඒ අනුව ඉතිරි තොගය බඳුන් 9,263 ක් වුවද 2010 දෙසැම්බර් 31 දිනට අවසාන තොගය ලෙස ශේෂ පත්‍රයේ රු.49,284 ක් වටිනා බඳුන් 23 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.19,848,756 ක් වටිනා බඳුන් 9240 ක් වූ තොගයක් පොත් වලින් අතහැර තිබුණි.

## 2.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

------------------------------------------

පහත සඳහන් එක් එක් අයිතමය ඉදිරියේ දක්වා ඇති තහවුරු ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| විෂය | මුදල | නොලැබුණු සාක්ෂි |
|---|---|---|
| | රු: | |
| අත්තිකාරම් ගෙවීම් - පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශ | 44,927,866 | සැලස්ම, ඇස්තමේන්තු, විස්තරාත්මක උපලේඛණ |
| ව්‍යාපෘති වියදම් - පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශ | 8,772,158 | කල වැඩ සහතිකය |

| | | |
|---|---|---|
| ඉතිරිතොග | 200,173 | තොග සමීක්ෂණ වාර්තා |
| ගෙවිය යුතු පුනරාවර්තන ආධාර | 6,723,045 | උපලේඛණ |
| යකඩ තහඩු 40 ක් මිලදී ගැනීම. | 1,222,857 | ඇස්තමේන්තුව,භාණ්ඩ ලැබීමේ තුන්ඩු (GRN) |
| 10% රැඳවුම් මුදල් | 6,874,089 | විස්තරාත්මක උපලේඛණ |
| වැඩපුර්ව අත්තිකාරම් | 20,909,285 | වැඩපුර්ව අත්තිකාරම් ලේඛණ |
| ජ'නල් සටහන් මගින් සිදු කල විවිධ ලැබීම් සහ ගෙවීම්. | 61,821,009 | අංක 01 සිට 198 දක්වා ජ'නල් සටහන් |

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීත ,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති ,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| **(i)** | මු:රෙ: 371 | 2010 අගෝස්තු 17 දින ලබා දුන් රු:650,000 ක අත්තිකාරම් 2011 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| **(ii)** | මු:රෙ:396(ඇ) | මාස 06 ඉක්මවු රු:69,076 ක චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මු:රෙ: ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මු:රෙ: 756 හා 757 | භෞතික වත්කම් සමීක්ෂණයක් පවත්වා අදාල සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මු:රෙ:1646 | ව්‍යාපෘතිය මගින් උපයෝජනය කරනු ලබන වාහන සම්බන්ධයෙන් වන ලොග් සටහන් පොත්, අනතුරු සම්බන්ධ ලේඛන, ඉන්ධන දැවීම සම්බන්ධ වාර්තා පවත්වා නොතිබුණි. |

**(ආ) චක්‍රලේඛ විධි විධාන**

| | |
|---|---|
| 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 (5:2) | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන හිමිකම් නොමැති ව්‍යාපෘති කාර්යය මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 4 ක් සඳහා 2008 ජූලි 28 දිනැති 271/1538/08 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. |

## 2.5 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

---------------------------------

ව්‍යාපෘති කර්යාලය පවත්වාගෙන යාම සඳහා මධ්‍යම පරිසර අධිකාරියට ගොඩනැගිලි කුලි වශයෙන් වාර්ෂිකව රු.මිලියන 3.2 ක් ගෙවා තිබු අතර කුලියට ලබාගත් ගොඩනැගිලලක ගරාජ ඉදිකිරිම වෙනුවෙන් ව්‍යාපෘතිය දරණ ලද වියදම රු.මිලියන 1.5 අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

**අරමුණ සපුරා නොතිබීම.**

(i) අයවැය ඇස්තමේන්තු වලට අනුව භාණ්ඩාගාරය විසින් ප්‍රමුඛතා ව්‍යාපෘතිය ලෙස පිළිසරු ඝණ අපද්‍රව්‍ය කලමනාකරණ වැඩ සටහන සඳහා කොළඹ දිස්ත්‍රිකකයේ හයිලෙවල් මාර්ග ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය කලමනාකරණ ක්‍රමයක් පිහිටුවීම ප්‍රධාන අරමුණ වුවද ස්ථිර තිරසාර ඝණ අපද්‍රව්‍ය කලමනාකරණ වැඩ සටහන් ඇති කිරීමේ එම අරමුණ සඳහා 2008 වර්ෂයේ රු. දශලක්ෂ 123 ක්, 2009 වර්ෂයේ රු. දශලක්ෂ 265 ක්, 2010 වර්ෂයේ රු. දශලක්ෂ 695 ක් වෙන්කර තිබු නමුත් 2010 දෙසැම්බර් වන විටත් මෙම වැඩ සටහන ආරම්භ කර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) නිසි පරිදි ඝණ අපද්‍රව්‍ය බැහැර නොකරන ලද පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් නීති කටයුතු ක්‍රියාත්මක කිරීම එක් අරමුණක් වුවද කොළඹ බ්ලුමැන්ඩල් හා නාවින්න හයිලෙවල් පාරෙහි, මෙලෙස අවිධිමත් ලෙස කසල බැහැර කිරීම නිසා පරිසරය දූෂණය වීම සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.7 අරමුදල් ඌන උපයෝජනය

----------------------------

කොරියානු ජාත්‍යන්තර සහයොගිතා ආයතනය (KOIKA) දොම්පේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා 2010 අගෝස්තු 20 දින රු: 10,000,000 ක් ලබා දී තිබූ අතර එම අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළ රු: 223,511 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව අදාල කාර්ය සඳහා යොදා ගෙන නොතිබූ රු:9,776,489 ක් වූ මුදල 2010 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

## 2.8 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පිළිසරු ව්‍යාපෘතියේ මූල්‍ය හා තාක්ෂණික අනුග්‍රහයෙන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල පිහිටි භූමිය තුළ ජෛව වායු ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2010 ජුලි 05 දින ගිවිසුමකට එළඹී අදාල කාර්ය වෙනුවෙන් රු:1,082,879 ක් ව්‍යාපෘතිය මගින් වෙන්කර තිබූ අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගිවිසුමේ වටිනාකමින් 30% ක් හෙවත් රු: 324,864 ක් 2010 ජුලි 05 දින ගෙවා තිබුණි. මෙම ගිවිසුමේ 2.5 වගන්තිය ප්‍රකාර පසු විපරම් කමිටුව සෑම මසකට වරක්ම රැස්වී ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇතුලත් වාර්තාවක් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු නම් කල නිලධාරියකු වෙතද මධ්‍යම පරිසර අධිකාරිය වෙතද ඉදිරිපත් කිරීමට සැලස්විය යුතු වුවද එසේ කටයුතු කර නොතිබූ අතර ගිවිසුම් දිනයේ සිට මාස 14 ක් ඉක්මවූ එනම් 2011 සැප්තැම්බර් 09 දින මෙම අත්තිකාරම් මුදල ආපසු ව්‍යාපෘතිය වෙත ලබා දී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.9 ව්‍යාපෘතියේ වාහන උපයෝජනය

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය සතුව වාහන 6 ක් පැවති අතර රියදුරන් 4 දෙනෙකු අනුයුක්ත කර ඇත. සමාලෝචිත වර්ෂයෙ වාහන ඉන්ධන අළුත්වැඩියා හා සේවා කිරීම වෙනුවෙන් රු:3,350,855 ක් වැය කර තිබු අතර ඊට පෙර වර්ෂයේ වියදම රු:2,868,589 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ එම වියදම 16.81% කින් වැඩිවීමක් සිදු වී තිබුණි.

(ආ) වාහන ඵලදායි හා රෙගුලාසි වලට අනුව උපයෝගි කර ගත් බවට තහවුරු වීමට ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබු අතර නිරීක්ෂණ වු අඩුපාඩු සැකවින් පහත දක්වා ඇත. වාහන ධාවන සටහන් වල මාසික ධාවන සාරාංශ අසම්පූර්ණව පැවති අතර ගමන් කළ නිළධාරීන් සහතික නොකළ අවස්ථා, රියදුරන් නොමැතිව ධාවන කළ අවස්ථා හා දිනපතා මධ්‍යම පරිසර අධිකාරිය තුලින් වාහන ධාවනය ආරම්භ නොකර වෙනත් ප්‍රදේශ වලින් ධාවන ආරම්භ කල අවස්ථා ද මයිලෝ මීටරයේ අවසාන හා ආරම්භ කියවීම් වල වෙනස්කම් නිරීක්ෂණය විය.

## 3. ව්‍යාපෘති කාර්ය සාධනය

---------------------------

### (අ) මූල්‍ය කාර්යය සාධනය

--------------------------

සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියට අදාල ක්‍රියාකාර සැලැස්ම හා සත්‍ය වියදම් පරීක්ෂාවේදී ක්‍රියාකාර සැලැස්ම ඵලදායී පාලන කාරකයක් වශයෙන් ව්‍යාපෘතියේ කටයුතු සඳහා යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(i) ක්‍රියාකාර සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදිත මුදල රුපියල් මිලියන 695 කි. සත්‍ය වියදම රුපියල් මිලියන 410 ක. ඒ අනුව ඌන උපයෝජිත මුදල රුපියල් මිලියන 285 ක් හෙවත් ප්‍රතිශතය 41% විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කළ ඇස්තමේන්තුගත වියදම් සීමාවන් ඉක්මවා විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘති ක්‍රියාකාරකම් 04 ක් සඳහා මිලියන 8.754 ක වියදම් ව්‍යාපෘතියේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණි.

(iii) ක්‍රියාකාර් සැලැස්මට අනුව කාර්යයන් 12 කට අදාලව වෙන්කර තිබූ රු:56,800 ක් වූ ප්‍රතිපාදන කිසිවක් සමාලෝචිත වර්ෂය තුලදී වැයකර නොතිබුණ.

(iv) ක්‍රියාකාර් සැලැස්මට අනුව ප්‍රතිපාදන වෙනකර තිබූ තිබූ කාර්යයන් 05 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදි වැය කර තිබුණේ 10% කටත් වඩා අඩු ප්‍රතිපාදනයක් වන අතර 50% ට වඩා අඩුවෙන් ප්‍රතිපාදන වියදම් වී ඇති කාර්යයන් ගණන 06 කි.

(ආ) **භෞතික කාර්යය සාධනය**

-----------------------------

පිළිසරු ව්‍යාපෘතියේ මූලික අරමුණ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමය. ඉහත කාර්යය සපුරා ගැනීම සඳහා 2008 - 2010 තුන් අවුරුදු කාලපරිච්ඡේදය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රුපියල් බිලියන5.6 ක වැය ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ශ්‍රී ලංකා රජයේ අයවැය ඇස්තමේන්තුව අනුව ප්‍රතිපාදිත මුදල සහ සත්‍ය වියදම පහත පරිදි වේ.

| | 2008 | 2009 | 2010 |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදිත මුදල | 107,553,359 | 877,080,000 | 695,000,000 |
| සත්‍ය වියදම | 107,553,359 | 252,743,886 | 410,194,602 |
| ෙයා්ජනය ප්‍රතිශතයක් ලෙස | 100% | 29% | 59% |

ඉහත වගුවෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයෙ දරණ ලද වියදම් තුල කොම්පෝස්ට් අංගන ඉදිකිරීම හා ඉඩම් පිරවුම් සඳහා රු:164,081,106 ක්ද කුඩා පරිමාණ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති වෙනුවෙන් නගර සභා හා ප්‍රාදේශීය සභා වලට රු:33,666,023 ක මුදලක් ද බිම් පිරවුම්

ස්ථාපිතකිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතියේ මූල්‍ය සහාය මත ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් රු:35,700,024 ක මුදලක් ද ලබා දී තිබුණි.

(ii) පිළිසරු ව්‍යාපෘතියේ මූලික අරමුණ වූ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා 2008 වර්ෂයේ සට 2010 වර්ෂය දක්වා රු:2,079,613,359 ක මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන් කර ගෙන තිබූ අතර සත්‍ය වශයෙන් රු:770,491,847 ක් වියදම් දරා ඝණ අපද්‍රව්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණි. යථෝක්ත වියදම් දරා තිබුණද ව්‍යාපෘතියේ මූලික අරමුණ යටතේ කොළඹ නාගරික සීමාව තුළ දෛනික එකතුවන කසල ටොන් 800 ක ප්‍රමාණය හා මහරගම නගර සභාව තුළ දෛනික එකතුවන කසල ටොන් 50 ක ප්‍රමාණය කළමනාකරණය කිරීම සඳහා 2011 වර්ෂය දක්වාම විසඳුමක් ලබා දී නොතිබුණි.

**(ඇ) කොම්පෝස්ට් අංගන ඉදිකිරීම.**

---------------------------------

(i) <u>කොලොන්නාව පොතුවිල්කුඹුර කොම්පෝස්ට් අංගනය</u>

මෙම අංගනයෙ දෛනිකව කසල මෙට්‍රික් ටොන් 40 ක් කළමනාකරණය කිරීම අරමුණ වී තිබුණි. 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වර්ෂ 3 කදි රු:156,170,000 ක ප්‍රතිපාදනය කර රු:105,502,007 ක ගිවිසුම් ගත වටිනාකමක් මත රු:36,619,155 ක් වියදම් දරා තිබුණි. මෙම ඉදිකිරීම 2010 ජනවාරි 22 දින ආරම්භ කර මාස 09 ක කාලයක් තුල අවසන් කළ යුතු විය. එසේ වුවද කොම්පෝස්ට් අංගනය භෞතිකව පරීක්ෂාවට ලක් කල 2011 අගෝස්තු 23 දින වන විටත් වැඩ අවසන් කර භාර දී නොතිබුණි. කසල කළමනාකරණ ව්‍යාපෘතියට අත්‍යවශ්‍යම අංගයක් වූ කේබල් යන්ත්‍ර 2011 අගෝස්තු 23 දින භෞතිකව පරීක්ෂාව වන විටත් ප්‍රතිස්ථාපනය කර නොතිබුණ අතර ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි 2009 දෙසැම්බර් 18 දිනැති ව්‍යාපෘතිය පිරිනැමීමේ ලිපියේ 02 හා 03 වගන්තිය අනුව කාර්ය සාධන ඇපකරයක් තැබිය යුතු වුවද එසේ සිදු නොතිබුණි. එම කසල කන්ද තුලන් උත්පාදනය වන අපදියර ජලය විශාල ප්‍රමාණයක් කොලොන්නාව ඇල මාර්ගයට එකතුවී පිටවන බව නිරීක්ෂණය විය. ඒ සඳහා නිසි කළමනාකරණ වැඩ පිළිවෙලක් ව්‍යාපෘතිය තුල නොවීය. මැසි මදුරුවන් ගහන විශාල ප්‍රදේශයකට දුඟද හමන ප්‍රදේශයක් කොම්පෝස්ට් අංගනය තුල නිර්මාණය වී තිබුණි.

(ii) වැලිගම නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරනය සඳහා නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

ඉදිකිරීම් අදියර දෙකකින් සමන්විත වන අතර ඉදිකිරීම් I අදියර සඳහා 2008 වසරේ ප්‍රතිපාදනය රු:1,446,800 ක් වූ අතර අදියර II සඳහා ඇස්තමේන්තුව රු:1,510,225 ක් විය. නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ඇරඹීම සඳහා 2008 මධ්‍යම පරිසර අධිකාරිය හා වැලිගම නගර සභාව එක්ව රු:1,500,000 ක ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ සඳහා ප්‍රතිපාදන මුදලින් 2008 හා 2009 වර්ෂ වලදී රු:1,366,264 ක වියදම් දරා තිබුණි.ඉදිකිරීමේ II අදියර වෙනුවෙන් යෝජිත ඇස්තමේන්තුව සකස කර අනුමත කර තිබූ අතර ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දී නොතිබුණි. ඒ අනුව අඩක් නිම කල පුහුණු මධ්‍යස්ථානයක් භෞතිකව නිරීක්ෂණය වූ අතර ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු සිදු නොකර වසර තුනක් නිශ්කාර්යව පැවතිමට ඉඩහැර තිබීම.ගිවිසුමේ සඳහන් අරමුණුවලට පටහැනිව මේ වනවිට ඉදිකරීම් කටයුතු අවසන් කර ඇති කොටසේ වැලිගම නගර සභාව විසින් සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූ අතර කොම්පෝස්ට් නිපදවීම පිළිබඳ පුහුණුවීම් පැවැත්වීමේදී මෙම පුහුණු ආයතනය ඉදිකිරීම් අවසන් කර යොදා නොගෙන ව්‍යාපෘතිය මගින් පුහුණුවීම කටයුතු කිරීමට හෝටල් සඳහා රු:254,049 ක අමතර වියදම් දරා තිබුණි.

(iii) කුලියාපිටිය නගර සභා කොම්පෝස්ට් අංගනය

දෛනිකව කසල ටොන් 08 ක් කළමනාකරණය කිරීම අරමුණවී තිබුණි.2009 වර්ෂය සඳහා ඇස්තමේන්තුව රු:38,292,000 ක් වූ අතර වියදම රු:25,879,845 ක් විය.ව්‍යාපාතිය 2009 පෙබරවාරි 07 දින විවෘත කර තිබුණි.2011 අගොස්තු 09 දින භෞතික පරීක්ෂාවේදී කොම්පොස්ට් නිෂ්පාදනය කෙරෙමින් පැවතුන අතර කසල තේරීම සඳහා සේවකයන් 12 දෙනෙකු විසින් යන්ත්‍ර සූත්‍ර භාවිතා නොකර සිදු කල බව නිරීක්ෂණය වූ අතර මෙම ව්‍යාපාතිය සඳහා උපකරණ මිලදී ගැනිමට පිළිසරු ව්‍යාපෘතිය මගින් රු:31,576,075 ක මුදලක් ලබාදී තිබුනද ලබාගත යුතු උපකරණ පිළිබඳ විස්තරයක් හෝ ලබාගත් භාණ්ඩ පිළිබඳ විස්තරයක් ව්‍යාපාතියට ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. තවද කොම්පොස්ට් සාදා ඉවතලන නොදිරන ද්‍රව්‍ය විවෘත භූමියේ ගොඩගසා තිබූ අතර ඒ සඳහා විසදුම් ලබාදී නොතිබුණි.

(iv) පන්නල ප්‍රාදේශිය සභා ඝන අපද්‍රව්‍ය කලමනාකරණය ව්‍යාපෘතිය

දෛනිකව කසල ටොන් 03 ක් උපයෝගි කොට මාසිකව කොම්පොස්ට් ටොන් 18 ක් නිෂ්පාදනය කිරීම අරමුණු වී තිබුණි. 2009 වර්ෂයේ ඇස්තමේන්තුව රු:4,061,130 ක් වූ අතර රු:4,032,280 ක් වියදම් දරා තිබුණි.ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කර ඇත ව්‍යාපෘති වාර්තාව අනුව දැනට දිනකට නිෂ්පාදනය කරන කොම්පොස්ට් ප්‍රමාණය ටොන් 0.6 කි. මෙය අපේක්ෂිත තත්ත්වය ලෙස ව්‍යාපෘතිය විසින් පෙන්වා දි තිබුණි. ඉවතලන නොදිරණ ද්‍රව්‍ය විවෘත භූමියේ

ගොඩගසා තිබුණි. ඉවතලන ද්‍රව්‍ය වෙනුවෙන් කිසිදු ව්‍යාපෘතියක විසදුම් ලබාදී තිබු බව භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය නොවිය.

(v) **මාතර මහ නගර සභාවේ කොම්පොස්ට් අංගනය**

දෛනිකව කසල ටොන් 40 ක් කළමනාකරනය කිරිම අරමුණ වු අතර 2009 වර්ෂයේ ප්‍රතිපාදන රු:45,950,000 ක් විය.රු:26,286,562 ක් වියදම් දරා තිබුණි. මෙම අංගනය අක්කර 3 ක භූමි භාගයක පිහිටුවා තිබුණි. මෙම අංගනයට දෛනිකව කසල ටොන් 12 ක් පමණ ලැබෙන බව භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය වු අතර දෛනිකව ලැබෙන කසල ටොන් 40 ක ප්‍රමාණය තුළින් ගලායන අපදියර වෙනුවෙන් දිග 6' ක් හා පලල 5' කින් ද ගැඹුර 8' කින් යුක්ත ටැංකියක් සකස් කර ඇති බව නිරීක්ෂණය විය. අපදියර ගලා යාමේ පහසුකම (Leachete Treatment Facility)වෙනුවෙන් 2009 වර්ෂයේ රු:5,211,451 ක වියදමක් දරා තිබුණි. කොම්පෝස්ට් නිපදවීමේ පිටවන අපදියර එකතුවිමට සැලසුම් කර සාදා දි තිබු එම ටැංකිය අංගනයට ලැබෙන කසල ප්‍රමාණයෙන් පිටවන අපදියර ප්‍රමාණයට ප්‍රමාණවත් නොවන අතර එම ටැංකි තුළින් අපදියර පිටාර ගලමින් දුගඳ හමන තත්වයන් නිරීක්ෂණය විය.කුඩා කෘමින්ද මෙම අපදියර පිටාර ගලන ස්ථානය ආශ්‍රිතව දක්නට විය.තවද ඉවතලන ප්ලාස්ටික් හා ඉවතලන කොම්පෝස්ට් කල නොහැකි කසල වෙනම ගොඩ ගසා පැවතුණි.

(vi) **හික්කඩුව මොනරෝවියාවත්ත කසල කළමනාකරණ ව්‍යාපෘතිය**

කසල ටොන් 50 ක් කළමනාකරණය කිරිම සදහා සැලසුම් කර තිබුණි. අපේක්ෂිත කොම්පොස්ට් ප්‍රමාණය ටොන් 07 කි. 2010 වර්ෂයේ ප්‍රතිපාදනය රු:35,100,000 ක් හා 2011 වර්ෂයේ කෝන්ත්‍රත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තුව රු:83,432,427 ක් විය.රු:1,653,277 ක් සමාලෝචිත වර්ෂය සදහාද රු:39,388,575 ක් 2011 අගෝස්තු 31 දක්වා ඉදිකිරීම් වෙනුවෙන් ගෙවා තිබුණි. පළාත් පාලන ආයතන 06 ක කසල ප්‍රතිචක්‍රියකරනය කිරිම සදහා සැලසුම් කර තිබුණි.පිළිසරු ව්‍යාපෘතිය විසින් තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු වන පුද්ගලික සමාගමක් ඉදිරිපත් කළ මිල හා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති තවත් සමාගමක් විසින් ඉදිරිපත් කල මිල ගණන් අතර රු:18,360,980 ක වෙනසක් නිරීක්ෂණය විය.තවද ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි C2 හා C3 මට්ටමේ ඉදිකිරීම් ආයතන 05 ක් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබියදීත් 07 වන ස්ථානයට අවම මිල ගණණ් ඉදිරිපත් කල C3 මට්ටමේ ටෙන්ඩර්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. හික්කඩුව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම් ගිවිසුමට අනුව 2011 පෙබරවාරි 08 ව්‍යාපෘතිය ඉදිකිරීමේ කටයුතු සදහා පෞද්ගලික සමාගම වෙත භාරදුන් අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කර 2011 සැප්තැම්බර් 09 දින පිළිසරු ව්‍යාපෘතිය වෙත ආපසු භාරදිය යුතු වුවත් 2011 අගෝස්තු 26 දින භෞතිකව ව්‍යාපෘතිය පරීක්ෂාවට ලක් කිරීමේදී

ඉදිකිරීම් ප්‍රගතිය ඉතා අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. නමුත් 2011 ජනවාරි 01 සිට 2011 අගෝස්තු 31 දක්වා ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවා තිබූ මුළු මුදල රු:39,388,575 ක හෙවත් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 47% කි.උපදේශක ආයතනය ලෙස තෝරාගෙන තිබූ පෞද්ගලික ආයතනය වෙත 2010 වර්ෂයේදී රු:75,000,000 කට කොන්ත්‍රාත්ත වටිනාකමෙන් (රු:75,000,000 x 3% x 80%) රු:1,800,000 ක උපදෙශක ගාස්තුවක් තීරණය කර ඉන් රු:1,338,750 ක් ගෙවීම් කර තිබියදීත් 2011 වර්ෂයේදී කොන්ත්‍රාත්තු වටිනාකම නැවත රු:83,432,427 කට වෙනස් කිරීම නිසා නැවත උපදේශක ගාස්තුව (රු.83,432,427 x 3% x80%) රු:2,002,378 ක් සංශෝධනය කර තිබුණි. උපදේශක ගාස්තු මෙසේ ගෙවා තිබුණත් භූමියෙහි පසෙහි ස්වභාවය, ඉදිකල පැති බිත්ති නැවත කඩා ඉවත් කිරීම, ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කල කාල පරිච්ඡේදය ප්‍රමාණාත්මක නොවීම, ආදී කරුණු සලකා බැලීමේදී නිසි උපදේශක සේවා සැපයීමක් කර නොමැති බව නිරීක්ෂණය විය.

## 4. කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉදිරිපත් කල උපලේඛණ අනුව යෝජිත මහා පරිමාණ ව්‍යාපෘතිය හා කුඩා පරිමාණ ව්‍යාපෘති අතර මුදල් ඇස්තමේන්තුව සැකසීමේදි දෛනිකව කසල ප්‍රමාණය පදනම් කර ගත් විට අනුමත කර ඇති මුදල් ප්‍රමාණයන් වල විශාල විචලනයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | දෛනිකව කසල ප්‍රමාණය | ආවරණය කරන ලද පළාත් පාලන ආයතන | අනුමත මුදල රු: |
|---|---|---|---|---|
| (i) | මැදිරිගිරිය යුධගනාව ව්‍යාපෘතිය | 10 ටොන් | 02 | 22,848,484 |
| (ii) | අනුරාධපුර කිරික්කුලම ව්‍යාපෘතිය | 40 ටොන් | 04 | 77,322,024 |
| (iii) | කොලොන්නාව පොතුවිල්කුඹුර ව්‍යාපෘතිය | 40 ටොන් | 01 | 112,587,082 |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | කළුතර පොහොරවත්ත ව්‍යාපෘතිය | 38 ටොන් | 04 | 72,912,453 |
| (v) | මාතර මහ නගර සභාව | 40 ටොන් | 01 | 45,950,000 |
| (vi) | කුලියාපිටිය නගර සභාව | 08 ටොන් | 01 | 38,292,000 |
| (vii) | නාවලපිටිය මහ නගර සභාව | 08 ටොන් | 01 | 28,650,000 |
| (viii) | බදුල්ල මහ නගර සභාව | 25 ටොන් | 01 | 82,475,000 |
| (ix) | හික්කඩුව මොනරෝවියාවත්ත ව්‍යාපෘතිය | 50 ටොන් | 06 | 93,444,318 |
| (x) | කුරුනැගල සුන්දරාපොල ව්‍යාපෘතිය | 38 ටොන් | 02 | 48,000,000 |
| (xi) | වෙන්නප්පුව ප්‍රදේශය සභාව | 08 ටොන් | 01 | 21,500,000 |
| (xii) | තංගල්ල නගර සභාව | 08 ටොන් | 01 | 23,500,000 |
| | | | 24 | 643,981,361 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

**(i)** අනුරාධපුර කිරික්කුලම ව්‍යාපෘතිය, කොලොන්නාව පොතුවිල්කුඹුර ව්‍යාපෘතිය, මාතර මහ නගර සභා ව්‍යාපෘතිය සඳහා දෛනිකව කලමනාකරණය කල යුතු කසල ප්‍රමාණය ටොන් 40 ක් වුවද ඒ සඳහා වැය කරන ලද මුදල පිළිවෙලින් රු:77,322,024 , රු:112,587,082ක් හා රු:45,950,000 ක් වීය.

**(ii)** කළුතර පොහොරවත්ත ව්‍යාපෘතිය සහ කුරුණෑගල සුන්දරාපොල ව්‍යාපෘතිය මගින් දෛනිකව කසල ටොන් 38 කලමනාකරණය කිරීම සඳහා පිළිවෙලින් රු:72,912,453 ක් හා රු:48,000,000 ක් වැය කිරීම.

(iii) හික්කඩුව මොනරෝවියාවත්ත ව්‍යාපෘතිය හා බදුල්ල මහ නගර සභාවේ පිළිවෙලින් දෛනිකව කසල ටොන් 50 ක් හා 25ක් කලමනාකරණය කිරීම සඳහා පිළිවෙලින් රු:93,444,318 ක් හා රු:82,475,000 ක් වැයකර තිබීම.

5. **කොම්පෝස්ට් බඳුන් මිලදී ගැනීම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේදී පිළිසරු ව්‍යාපෘතිය මගින් රු:40,798,889 ක් වියදම් දරා කොම්පෝස්ට් බඳුන් 17,000 ක් බෙදා හැර තිබුණි. වටිනාකම රු:12,269,674 කට අයත් බඳුන් 5726 ක් වෙනුවෙන් භාණ්ඩ ලැබීමේ අධියාචනා පත්‍ර නිකුත් කර නොතිබුණි.

6. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවැය.

(ඇ) අත්තිකාරම් පියවීම.

(ඈ) ජර්නල් සටහන්.

(ඉ) ලේඛණ පැවැත්වීම.

(ඊ) ඉදිකිරීම් කොන්ත්‍රාත්

(උ) අරමුදල් උපයෝජනය

(ඌ)වාහන භාවිතය

(එ) සේවක කලමනාකරණය